
# යුධබිම





කතාව
හිරුන් හිමාංශ දිසානායක


# කතෘගේ වෙනත් කෘති

**ළමා කතා :-**




පළ කල දිනය - 2023.12.23

ISBN 978-624-206-976-0

# පිදුම

**පැමිණි බාධක හමුවේ**

**ජීවිතයේ නොයෙක්**

**අවස්ථාවල**

**වැටෙන්නට ඉඩ නොදී**

**මගේ හිත දැඩි කරමින්**

**මට ශක්තියක් වු**

**මාගේ දයාබර අප්පච්චිටත්**

**අම්මාටත් ආදරයෙන්**

**මා පුදමි**

**මගේ අකුරු කළ පොත් මල්දම**

**ඉත සිතින් ...........**



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ළදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# පටුන

01. නොහොඳ නෝක්කාඩුව ....................................01

02. සිත් ගත් ඇත්තෝ ...........................................06

03. කිතුලෙන් වැටීම ................................................12

04. සිහිනය සැබෑ වීම ............................................16

05. යුධබිම..........................................................................19

# 01.නොහොඳ නෝක්කාඩුව

පොද වැස්ස තවමත් හරි හැටි නතර වී නොමැති රුක්වැල්ල ගම්මානය ස්වභාවධර්මයාගෙන් පරිපූර්ණ වූ ඉතා අලංකාර ගමකි. ඈත කැලෑ රොදින් ඇසෙන අලියෙකුගේ කුංචනාදය සමඟ මුසු වන්නේ කුරුල්ලන්ගේ කිචි බිචි නාදය යි.එක් පැත්තකින් වසු පැටවකුගේ ‘උම්බෑ’ නාදය ඇසෙන විට තවත් පෙදෙසකින් කුඹුරේ අම්බරුවන් කෑ ගසන නාදය ඇසෙන්නේ පරිසරයේ සුන්දරත්වය මනාව කියා පාමිනි. මේ සියල්ල වරිච්චි ගෙයකින් වට වූ කාමරයක ජනේලයකින් බලා සිටින පාලිත ඈතින් තම පියා එනු දැක ඉහවහා ගිය සතුටකින් මිදුලට ගොස් ඔහුව වැළඳ ගත්තේ ය.

“හා..හා..පොඩි පුතේ ගෙට යං.වැස්සට තෙමිලා ලෙඩ වෙයි දරුවෝ ”

“හොඳයි අප්පච්චි, හනිකට යං ” එසැණින් දෙදෙනා එක විට ගෙතුලට ගොඩ වුහ. වැහි බින්දු නිරුවත් උඩුකයට වැටී ඇති නිසා සෝමරත්නගේ ගතේ හිරි ගඩු පිපී ඇත. කිසිදු ආදායම් ක්‍රමයක් නොමැති සෝමරත්න කිතුල් මඩින්නෙකි. සෑම දවසකම කිතුලට යන ඔහු තම පවුලට සරිලන ආදායමක් නොමැති වුවත් පාලිතගේ සහ පාලිතගේ වැඩිමහල් සොහොයුරිය වන චමිලාගේ බඩ කට පුරවන්න කුමක් හෝ දෙයක් ගෙන ඒමට අමතක නොකරයි.

“දයාවති, ඉක්මනට තේ කහට එකක් හදලා ගනින්... මාව ටිකක් වෙව්ලනවා වගේ.”

තද වැස්සට තෙමුණු නිසා සෝමරත්න පාලිතගේ මව වූ දයාවතිගෙන් තේ කෝප්පයක් ඉල්ලා සිටියේ ශරීරය උණුසුම් කර ගැනීමටයි.

“ඉන්ට ටිකක්, මං ඉක්මනට හදලා ගේන්නං ”

“හොඳා,හොඳා හකුරු කෑල්ලකුත් ගෙනෙං එහෙනම්.”

දයාවතී ඉතා උත්සහවන්ත ගැමි කාන්තාවකි. ඈ කාර්යය බහුල වූවත් තම දරුවන් දෙදෙනාගේ අධ්‍යාපන කටයුතු සොයා බලයි. සෑම දවාලකම ඇය සෝමරත්නගේ කිතුලට ගොස් තමා රසවත්ව පිසගෙන ආ දවල් ආහාරය තම සැමියාට දී සෝමරත්නට ඉටු කරදිය යුතු කාර්යයන් සොයා බලා වහා එය සිදුකිරීමට යුහුසුලු වන්නීය. පසුව ඇය නිවස බලා දිව එන්නේ රාත්‍රී ආහාරය සැකසීම අරමුණු කරගෙනයි.

"ලොකු දුවේ, මේ තේ කහට එක අප්පච්චිට ගිහින් දෙන්න."

"ඉන්න අම්මේ.... මං එනවා" චමිලා පාලිතගේ අක්කා ය. ඇයට නිවසේ දී අමතන්නේ 'ලොකු' කියා ය. ඇය පාසලේ දහය වසරේ ඉගෙනුම ලබයි. අධ්‍යාපන කටයුතුවලට දක්ෂ ඈ සමහර අවස්ථාවන්හි දී තම සොහොයුරු වන පාලිතට ගණිතය වැනි විෂයන් ද
උගන්වන්නී ය.

"අප්පච්චි....මෙන්න තේ බොන්න හකුරු කෑල්ලකුත් එක්ක."

"ආ....දෙන්න.කොහොමද ලොකු ඉස්කෝලේ තත්ත්වෙ ?" සෝමරත්න තම කතාව පැනයකින් පටන් ගත්තේ ය.

"ඕං අප්පච්චි අදත් ඉස්කෝලෙට ආවේ අලුත් ගුරුවරු දෙන්නෙක්.
මං නම් හිතන්නේ නෑ වැඩිකල් ඉඳීවි කියලා." චමිලා කලකිරීමෙන්
යුතුව කීවා ය.

"ඒකතමා බං මේ දුෂ්කර පැතිවලට ඇවිත් ඔය ගුරුවරු වැඩිකල් ඉඳීවි කියලා හිතන්න අමාරුයි. ඒත් පුතේ උඹලා හොඳට ඉගෙන ගන්ට ඕනෑ."
සෝමරත්නගේ හිතේ බලාපොරොත්තු ගොන්නක් ඇති බව චමිලා සැණින් තේරුම් ගත්තා ය.

“ඔව් අප්පච්චි... මං නං මගේ වැඩ ටික කරගන්නවා.ඒත් මල්ලි තමා,පොතක් නම් අල්ලන්නේම නැහැ, ඉස්කෝලේ යන එක විතරයි.”

මෙතෙක් වේලා සියලුම දේ අසා සිටි පාලිත තම කටහඬ අවදි කළේය.

‘අනේ මේ අක්කේ, ඔයා කටවහගෙන ඉන්නකෝ. අනික විභාගෙට තව කොච්චර කල් තියෙනවද ?’

‘හරි, හරි උඹලා කට වහගෙන හිටපල්ලා... පොඩි පුතේ ඉස්කෝලේ යනවනම් ඉගෙනගන්ට ඕනෑ. උඹලා ලොකු වුණාට පස්සේ තමා තේරෙන්නේ ඇයි අපි ඉගෙන ගත්තේ නැත්තේ කියලා.’

පාලිතගේ පියාට කේන්තිය ඉහවහා ගියේ ය.

පාලිත ක්ෂණයකින් නිදන කාමරයට ගොස් පැදුර මත හිඳගෙන අඬන්නට වුවේ ය. මේ හැඬීම කන වැකුණු දයාවතී දිවගොස් පාලිතට කතා කළා ය. ‘පොඩි පුතේ, ඇයි ඔය අඬන්නේ ?’

දයාවතී පාලිත ළඟ හිඳගත්තා ය.

‘අම්මේ,අක්කා මං ගැන අප්පච්චිට බොරු කිව්වා මම පොතක් අල්ලන්නෙම නැහැ කියලා.’

පාලිත හඬමින් කීවේ ය .

‘ඉතින් පුතේ, අක්කා කීවේ හරි දේ නේ. ඔයා පාඩම් කරන්නේ නැති නිසා මමත් දුකින් ඉන්නේ.ඒ නිසා පොඩි පුතේ අප්පච්චිගෙයි, මගෙයි හිත තවත් කඩන්නේ නැතුව පාඩම් කරපන්’

දයාවතී පාලිතගේ හිස අත ගාමින් පැවසුවා ය.

එදින පාලිත රෑ කෑම නිදන කාමරයට ගෙන ගොස් කෑමට තීරණය කළේ ය. මන්ද තම පියාගේ මූණ බැලීමට ලැජ්ජාවක් ඔහු තුළ හටගත් හෙයිනි. එහෙත් ඊට මත්තෙන් සෝමරත්නගේ කටහඬ ඇවදී විය.

“පොඩි පුතේ ටිකකට මෙහෙ වරෙන්.” පියාගේ කලින් තිබූ කේන්තිය ඔහු තුළ නොතිබුණ නිසා පාලිත මහත් පුදුමයට පත්විය. ඔහු සිතුවේ පියා තමා ගැන තවමත් කේන්තියෙන් පසුවන බවයි. පාලිත ඉක්මණින් තම පියා සිටින තැනට ගොස් බිම් පඩියක හිඳ ගත්තේ ය. හිතේ දෙගිඩියාවෙන් සිටි පාලිත පියා තමා හට පැමිණෙන්න යැයි අඬ ගැසුවේ තමාට ආපසු බැණ වැදීමට ද නැතිනම් වෙනත් කරුණක් කීමටද යන්න ඔහුට කුකුසක් විය. පාලිතගේ පෙර තිබූ දඟ හැසිරීම් මේ මොහොතේ නොතිබුණි. ඔහු කිසිවක් කතා කලේ නැති නිසාදෝ පාලිතගේ පියා කතාවට මුල පිරුවේ ය.

“හුඟක් රෑ වෙලා නේද ?”

පාලිත නිහඬව සිටියේ ය.

“පොඩි පුතා මාත් එක්ක තරහා වෙලාද ඉන්නේ ?” පාලිතට ඔහුගේ පපුව නතර වන්නාක් මෙන් දැනුණි. පාලිත බිම බලාගෙනම නිහඬව සිටියේ ය.

“අෑ බං, මොන අම්මට අප්පට ද තරහා යන්නැත්තේ තමන්ගේ දරුවා පාඩම් වැඩ කරන්නේ නැතුව ඉන්නකොට. උඹ දැන් ඒක අමතක කරපං”

පාලිතට පඩියේ හිඳගෙන ඉන්නට ද බැරි බවක් දැනුණේ ය. සෝමරත්න තම පුංචි පුතාට තමා ළඟට එන ලෙස සංඥා කළේ ය. එය ප්‍රතික්ෂේප නොකළ යුතු නිසා පාලිත තම පියා ළඟට ගියේ ය. සෝමරත්න පාලිතව තමා අසළින් වාඩි කරවා කුරක්කන් රොටී කීපයක් සමග දඩමස් හොදි තවරා තම පුතුට කවන්නට විය.

“රස ද මගෙ පුතේ?” සෝමරත්න නිශ්ශබ්ද තම පුතුගෙන් විමසුවේ ය.

“හ්ම් ...ගොඩක් රසයි අප්පච්චි” සෝමරත්න කුරක්කන් රොටී කිහිපයක් කවමින් පොඩි පුතාට කතා කළේ ය.

“පුතේ ... උගත් මිනිස්සු තමයි මේ ලෝකේ ඉස්සරහට යන්නේ. දුප්පත් අපි වගේ එවුන් එදා වේල හම්බකරගෙන ඉන්නංවාලේ ඉන්නවා. මට ඕන උඹට හරි පාර පෙන්නලා දීලා හොඳ මහත්තයෙක් කරවන්න”

තම පියාගේ ඒ වචනවලින් පාලිතට කඳුලක් නොනැගුණාම නොවේ. පියා තමා පිළිබඳ බලාපොරොත්තු රැසක් ඇති කරගෙන සිටින බව ඔහු දැන ගත්තේ ය. පාලිත කුස්සියට ගොස් එහි බංකුවක හිඳ ගත්තේ ය. එවිට දයාවතී පුතු අසළට පැමිණියා ය.

“පුතේ උඹ තාම කෑවේ නැහැ නේද?”

“නෑ අම්මේ, අප්පච්චි මට රොටී කැව්වා” දයාවති මඳ සිනාවක් පා කුස්සියේ තිබූ හැළි වළං සෝදන්නට පටන් ගත්තා ය. අනතුරුව පාලිත මවට සහ පියාට වැඳ නිදන කාමරයට පිවිසුණේ ය. පැදුර මත නිදා ගන්නට සැරසුණු ඔහු තම සරම හිස වන තෙක් පොරවා කවුළුවෙන් රෑ අහස දෙස බලා සිටියේ ය. සඳ තමා දෙස බලා සිට තාරකා මඬුල්ල සමගින් මනරම් නර්තනයක යෙදෙන්නාක් මෙන් ඔහුට පෙනෙන්නට විය.

# 02.සිත් ගත් ඇත්තෝ

එදින සඳුදා දවසක් විය. චමිලා සහ පාලිත පාසල් යෑමට සූදානම් වූහ. ඔවුන් දෙදෙනාම ගමේ පාසලට ගියත් පාලිත පාසල වෙත යන්නේ ඉගෙන ගැනීමට නම් නොවේ.ඒ පාසලේ මිතුරන් සමඟ කෙළි සෙල්ලමේ යෙදීම ඔහුගේ එකම පරමාර්ථය වන බැවිනි. එහෙත් චමිලා පාසලේ සියලු දෙනාගේ ආදරය දිනාගත් ශිෂ්‍යාවක් වූවා ය. සෑම විටම ඇය පන්තියේ පළමුවෙනියා වන අතර ඉගෙනීමට මෙන්ම ක්‍රීඩාවටද තම දක්ෂතා පෙන්වීමට සමත් විය. පාලිත දඟකාරකම් කරන අවස්ථාවන්හි දී ඔහු ගුරුවරුන්ගේ අප්‍රසාදයට පවා ලක් විය.

"පාලිත අක්කාව ආදර්ශයට අරන් වැඩ කරන්න. පොතේ එක පිටුවක්වත් ලියලා නැහැනේ."

එවැනි අවස්ථාවලදී පාලිත තම ගුරුවරුන්ගෙන් සුළු දඬුවම්වලට ලක් වන්නේ ය. ඒ මොහොතේ ඔහු අදිටන් කරගන්නේ තවත් දිනෙක මෙවැනි දඟකම් ඔහු අතින් සිදු නොවීමට වගබලා ගැනීමට ය.

"මල්ලී, ඉක්මනට යං පරක්කු වෙලා..." චමිලා පාලිතට කතා කළේ ඒ වන විටත් පාසලේ සීනුව නාද වීමට ළං වී තිබූ හෙයිනි.

"ඉන්ට ටිකක්. මං හනිකට එන්නම් අක්කේ" පාලිත තේ

උගුරක් බී තම සොයුරිය වෙත දිව ගියේ ය.

"මල්ලි,ඔයා හැමදාම පරක්කු වෙනවා. හෙට නම් ඔය සෙල්ලම් බෑ"

"අක්කට පොඩ්ඩක් පරක්කු වෙන්න බැහැනේ. යමු ඉතින් උගුඩුවෙක් වගේ බලන් ඉන්නේ" දෙදෙනාම තම මවට සහ පියාට වැඳ අත පාර දිගේ කෙමෙන් කෙමෙන් නොපෙනී ගිය හ. පාලිත පාර දිගේ ගමන් කරමින් කතාවට මුල පිරුවේ ය.

“මේ අක්කේ ඔයා කොහොමද හැමදාම පන්තියේ පළවෙනියා වෙන්නේ ? ” පාලිත චමිලාගෙන් විමසුවේ ය.

“පන්තියේ පළවෙනියා වෙන්නේ ද ? ඒකට ඉතින් හැකියාවත්, වාසනාවත් තියෙන්න ඕනේ.”

චමිලා මඳ සිනහවක් පාමින් කීවා ය.

“හරි,හරි මට කියන්නකෝ මොකක්ද ඒ හැකියාව කියලා ?” පාලිත යළිත් චමිලාට ප්‍රශ්නයක් යොමු කළේ ය.

“ඒවා මෝඩයොන්ට තේරෙන්නේ නැහැ.”චමිලා සිනාසෙමින් කීවා ය.

“අා... එහෙමද ? හැමදාම පන්තියේ අන්තිමයා වෙන්නත් හැකියාවක් තියෙන්න ඕනේ හරිද ?”

සුළු මොහොතකින් ඔවුන් පාසල වෙත පිවිසුණ හ. ඒ වන විටත් පාසල ආරම්භ වී තිබුණි. දෙදෙනා තම පන්ති කාමර වෙත යන්නට ප්‍රථමයෙන් චමිලා පාලිතට කතා කළා ය.

“මල්ලි මේ... අද නම් පිට්ටනියේ ඉඳලා එහෙම අහුවෙන්න එපා. මොකද දන්නවද ගුරුවරු බනින්නේ ඔයාට නෙවේ මට. මල්ලිව හදාගන්න බැරිද කියලා”

චමිලා කලකිරීමෙන් කීවා ය.

“හරි,හරි ඒක ගැන මං බලාගන්නම්කෝ...”

පාලිත ඒ කිසිවක් ගණන් නොගෙන පන්ති කාමරයට දිව ගියේ ය.

ඔහු පන්ති කාමරයේ දොර අසළ සිටගෙන පන්ති භාර ගුරුතුමියට මෙසේ කතා කළේ ය.

“ටීචර්, මං ආවා...” පාලිත තම ගුරුතුමියව ඇමතුවේ බිම බලමිනි.

“අා...පාලිත. අදත් පරක්කු වෙලා ආවනේ එහෙනම් ? මෙච්චර වෙලා කොහෙද හිටියේ ? ගමේ රවුම් ගැහුවද ?”

ගුරුතුමිය පාලිත ළඟට පැමිණියේ වේවැල ද අතැතිව ය.

"අනේ නෑ ටීචර්, මං මේ... උදේ නැගිටින්න ටිකක් පරක්කු වුණා."

"පටාස්. "..

ගුරුතුමිය පාලිතගේ කකුලට වේගයෙන් පහරක් ගැසුවා ය.

දිනපතාම ඔහු දඬුවම් විඳින නිසා එයින් පාලිත කිසිඳු ලැජ්ජාවකට පත් නොවී ය. පන්තියේ සිටීමට අකමැති වූ ඔහු සිටියේ තම පන්තිභාර ගුරුතුමියගේ කරදරකාර ඉතිහාස කාලච්ඡේදය අවසන් වන තෙක් බලා සිටිමිනි. සීනුව වැදුනු වහාම පන්ති කාමරයෙන් එළියට පැනගත් පාලිත අවට සිටින ගැහැණු ළමයින්ගේ කොණ්ඩා ඇදීමට පටන් ගත්තේ ය. සැණෙකින් පන්තියේ ඉංග්‍රීසි ගුරුවරයා එනු දැක හැකි ඉක්මනින් පාලිත තම මිතුරන් සමගින් පන්තියට රිංගා ගත්තේ තමා නිසා යහළුවන් දඬුවමෙන් බේරා ගැනීම උදෙසා ය.

"පාලිත, මම දැක්කා ඔයා එළියේ මේ අහිංසක ගැහැණු දරුවන්ගේ කොණ්ඩා අදිනවා."

ඉංග්‍රීසි ගුරුවරයා පාලිත දෙස රෞද්‍ර බැල්මෙන් බලා සිටියේ ය.

"පිස්සුද සර් ? මම එහෙම දෙයක් කළේ නැහැ. මේ සුගත් පල්ලා ඇත්තමයි කියන්නේ." ඉංග්‍රීසි ගුරුතුමා පාලිතට ඔහුගේ අත ඔසවන්නැයි කියා වේවැලෙන් පහර දෙන්නට විය.

විවේක කාලය එළැඹුනි. කිසිදා විවේක කාලයට කෑම රැගෙන නොයෙන පාලිත කුසගින්නේම පිට්ටනියට ගොස් සෙල්ලම් කරන්නේ ය. එදිනත් සෙල්ලම් පිට්ටනියට ගිය පාලිත එහි තිබූ ගල් කිහිපයක් ගෙන පිට්ටුවක් සාදා ඔහුගේ මිතුරන් සමඟ සෙල්ලම් කරන්නට වූ අතර තම මිතුරන් පාර දෙස පුදුමයෙන් බලා සිටිනු දුටු පාලිත ඔවුන් සමඟ එක් විය.

"ඇයි උඹලා පාර දිහා බලාගෙන ඉන්නේ ?"

"පාලිත, මොකක්ද අර ඈතින් තියෙන්නේ ?"

පාලිතද පාර දෙස බලා පුදුමයට පත්විය. එහි තිබුණේ විශාල  හමුදා වාහනයකි. එය පාරේ නවත්වා තිබිණි. හමුදා නිලධාරීන්  එළියට බැස අවට සෝදිසි කරමින් සිටියෝ ය.

එසැණින් එතැනට පැමිණි පාසලේ විදුහල්පති වූ චන්ද්‍රසේකර මහතා හමුදා නිලධාරීන් සමඟ කතා කරන්නට වුවේ ය.

ස්වල්ප මොහොතකින් චන්ද්‍රසේකර මහතා යළිත් පාසලට පැමිණ පාසල් ළමුන්ට කතා කළේ ය.

“දුවලා, පුතාලා අද ඔයාලව වේලාසනින් ගෙවල් වලට යවන්න  අපි තීරණය කළා. ඒ නිසා හැකි ඉක්මනින් තම තමන්ගේ   ගෙවල් වලට යන්න.” “හොඳමයි ලොකු සර්” කලබල වූ පාසල් ළමුන් රිලව් රැලක් මෙන් තමන්ගේ පන්ති කාමරයට ගොස් ඔවුන්ගේ පොත් ගෙන තම නිවෙස වෙත  ගමන් කරන්නට වූහ.

“අක්කේ,අර වාහනෙ ඉන්න අමුතු ඇඳුමක් ඇඳ ගත්තු කට්ටිය කවුද?”

පාලිත චමිලාගෙන් එවන් ප්‍රශ්නයක් ඇසුවේ ඔහුගේ සිතේ යම්කිසි කුකුසක් මතු වූ හෙයිනි.

“මමත් දැකලා නම් නැහැ. ඒත් අහලා තියෙන විදිහට එයාලා හමුදාවෙන් වෙන්න ඇති මල්ලි.” චමිලා ද එසේ කීවේ හරිහැටි නොදන්නා සෙයිනි.

දෙදෙනාම ඔරලෝසුවේ දොළහ පසුවන්නටත් පෙර වරිච්චි ගෙදරට ගොඩ වූහ. අම්මාත්, තාත්තාත් නිවසේ නොරැඳීම නිසා මුළු නිවසම පාලු ස්වභාවයක් ගෙන තිබුණි. ඒ නිසාම ඔවුන් ගොලුවත රකින්නට විය.

"අක්කේ, අම්මයි අප්පච්චියි නැති නිසා ගේත් එක්ක පාලුවට ගිහින් නේද ? "

පාලිත ඈත කෙත් වතු දෙස බලමින් කීවේ ය. "ඔව් මල්ලි, තව ටිකකින් අම්මා කිතුලට ගිහින් එයි. අනිවාර්යෙන් අප්පච්චිට කෑම දෙන්න ගියා වෙන්න ඇති."

චමිලා පිළිතුරු දුන්නා ය.

දයාවතී සෝමරත්නට බත් මුල දී නැවත නිවසට පැමිණියේ කඩ මණ්ඩියට ගොස් එළවළු ද රැගෙන ය. ඈතින් තම මව එනු දුටු පාලිත මිදුලට බැස දයාවතී ගෙනා එළවළු මල්ල ඉක්මනින් උදුරා දුවගෙන ගොස් කුස්සියේ පැත්තකින් තැබුවේ ය.

දයාවතීට තම දරුවන් දෙදෙනා මෙතරම් වේලාසනින් ගෙදරට පැමිණීම විශාල ප්‍රශ්නයක් ගෙන දුන්නා ය.

"අෑ බං, උඹලා ඇයි මේ වෙලාවේ ගෙදරට ආවේ ?" ඇයගේ ඒ ප්‍රශ්නයට පාලිත කුස්සියේ සිටම පිළිතුරු දුන්නේ ය.

"අම්මේ, ලොකු සර් අද අපිව කලින්ම ගෙදර යැව්වා. ඉක්මනින් යන්න කියලා කිව්වා. තව පාරේ ලොකු වාහනේකුත් තිබ්බා. අක්කානම් කිව්වේ ඒ අර අමුතු ඇඳුමක් ඇඳන් ඉන්නේ..."

පාලිත ඒ ගැන සිතමින් සිටින විට චමිලාගේ කටහඬ අවදි විය.

"මං නම් හිතන්නේ ඒ ඇවිත් හිටියේ හමුදාවෙන් කියලා. එයාලා ඇවිත් හිටියේ ලොකු වාහන, තුවක්කු එහෙම අරගෙන. හිතෙනකොටත් බය හිතෙනවා."

චමිලා තම මවට විස්තරාත්මකව කීවා ය.

"එහෙනම් මොකක් හරි වින්නැහියක්ද ද දන්නෑ නේ දුවේ"

දයාවතී එලෙස කියන විට පාලිතගේ සහ චමිලාගේ ඇස් උඩ ගිය අතර සිහිනෙකින්වත් නොසිතූ විරූ ලෙස ඔවුන් මේ ප්‍රදේශයට පැමිණ ඇත්තේ කුමකටදැයි සැමටම කුතුහලයක් ගෙන දිණි. රාත්‍රිය එළැඹුනි. කිතුලට ගොස් යළි තම නිවස වෙත ආ සෝමරත්න මහත් කුසගින්නකින් පසුවිය. ඒ කෙසේ වෙතත් සිදු වී ඇති දේ පැවසූ දයාවතී තම සැමියා දෙස අසරණ බවකින් යුතුව බලා සිටියා ය.

"මම නම් හිතන්නේ කොටි මෙහෙට ඇවිල්ලා නැහැ. එක්කෝ  මෙහේ සෝදිසි කරන්න ආවා වෙන්නැති, නැත්නම් උන්ගේ  ගජයෙක් මෙහේ ඉන්නවානම් උෟව හොයන්න ආවා වෙන්නැති. කෝකටත් උඹලා ප්‍රවේසමෙන් ඉදපල්ලා. මොකද කොයි වේලේ වෙඩි සද්දේ ඇහෙයිද දන්නෑ නේ."

සෝමරත්න බුලත් විටක් සපමින් කීවේ ය.  පාලිත ඒ අමුතු මිනිසුන් පිළිබඳව සිතන්නට වුවේ ය. ඔහු ඒ ඇඳුම්වලට, ආයුධ වලට, වාහන වලට ඇලුම් කරන්නට වුවේ ය. කිසි දිනෙක දැක නොමැති මේ අමුතු පුද්ගලයින් හට පාලිතගේ හිතේ කොනක ඉඩක් වෙන්ව තිබුණේ ඔහුටත් එවැනි පුද්ගලයෙකු වන්නට හැකි වේවි යැයි සිතමිනි.  හිරු පායා දවස ආලෝකමත් වෙද්දී සෝමරත්න තම දරු දෙදෙනා පාසල් නොයැවීමට කටයුතු කළේ ඔවුන්ට කුමක් හෝ අනතුරක් වේ යැයි බියෙනි.

# 03.කිතුලෙන් වැටීම

"දයාවතියේ, මං යනවා. ලොකු,මල්ලිත් එක්ක ගෙදර ඉඳලා පාඩම් කරන්ට ඕනෑ."

උදෑසනින්ම සෝමරත්න කිතුලට යෑම සඳහා පිටත් වීමට පෙර මිදුලට දිව ආ පාලිත සහ චමිලා තම අප්පච්චිට දණ ගසා වැන්දෝ ය.

"පරිස්සමින් යන්න අප්පච්චි"

දෙදෙනා එකටම කීවෝ ය.

පාලිත තේ කහට එක හනිකට බී මිදුලට බැස සෙල්ලම් කරන්නට වුවේ ය. චමිලා පාලිත ළඟට පැමිණියේ පාඩම් වැඩ කිරීමට ය.

"මල්ලී, එන්න මාත් එක්ක පාඩම් කරන්න. ඊයේ ගණන් වල දුන්න ගෙදර වැඩත් තියෙනවා නේද ?"

"හරි, හරි අක්කේ. මම තව ටිකකින් එන්නම්. සෙල්ලම් කරන්න එළියට බැහැපු ගමන්ම කියනවානේ."

පාලිත තම අක්කාගේ අදහසට අකමැත්ත පළ කළත් චමිලා පාලිතගේ අත අල්ලගෙනම ගෙට ගොඩ වැදුණේ ය. පාලිත තම අක්කාත් සමඟ පාඩම් වැඩ ඒ මොහොතේ කළත් ඔහුගේ සිත දිව ගියේ හමුදා සෙබලුන් කෙරෙහි ය. පාලිත ඔවුන්ගේ ඇඳුම්වලට, ආයුධ වලට ඉමහත් කැමත්තක් දැක්වුවේ ය.

"මල්ලී මොනවද උඩ බලාගෙන කල්පනා කරන්නේ ?"

"නෑ, මේ... අක්කේ, මං ඔයාගෙන් ප්‍රශ්නයක් අහන්නද ?"

"කියන්න, මං ගාව ඕවාට හොඳ උත්තර තියෙනවා." චමිලා

ආඩම්බරයෙන් කීවා ය.

"අක්කා, ලොකු වෙලා වෙන්න කැමති මොනවගේ කෙනෙක්ද ?"

"මම ලොකු වෙලා වෙන්නේ දොස්තර කෙනෙක්. ඔයා ලොකු වෙලා වෙන්නේ කවුද ?" "මම කැමති හමුදාවට යන්න."

චමිලා මල්ලීගේ පිළිතුරත් සමඟ කල්පනාවට වැටුණා ය. ඇය හමුදාව, යුද්ධය, තුවක්කු, බෝම්බ වැනි වචන මතක් කිරීමට අකමැති වූවා ය.

"මල්ලි, හමුදාවට ගියොත් ආපහු ගෙදර එන්න වෙන්නේ නම් නැහැ. රට ආරක්ෂා කරනවා තමයි. ඒත් ජීවිතය ගැන විශ්වාසයක් තියාගන්න අමාරුයි මල්ලි."

ඇය කම්පාවෙන් යුතුව කීවා ය. දයාවති කුස්සියේ උයමින් සිටින විට පහළ ගමේ සුද්දාගේ කටහඬ ඇයට ඇසෙන්නට විය. ඇය ගෙදර දොරකඩ අසළට එන විට සුද්දා හති දමමින්, දහදිය පිස දමමින් මිදුලේ සිටගෙන සිටියේ ය.

"මොකද සුද්දා මල්ලී මේ පැත්තේ ?"

දයාවති ඔහුගෙන් විමසුවා ය.

"අනේ දයා අක්කේ, අර කිතුල පැත්තේ..."

සුද්දා තම හතිය නිසා වචනයක්වත් එළියට දැමීමට අපොහොසත් විය.

"අක්කේ, සෝමේ අයියා කිතුලෙන් වැටිලා." සුද්දා එකදිගට කියාගෙන ගියේ ය.  දයාවතිගේ මුළු සිරුරම සීතල වී ගියාක් බඳු විය. කෑ ගසමින් සිටියදීම ඈ සිහසුන්ව ඇද වැටුණාය. චමිලා සහ පාලිත වහා දුවගෙන විත් මහත් අසීරුවෙන් ඈ ඔසවාගෙන ඇඳ මත තැබූහ. වතුර ටිකක් ඉසීමෙන් පසුව නැවතත් ඈ මහත් සේ

ලතෝනි දෙමින් හඬා වැළපෙන්නට වූවා ය.

"අනේ මාමේ, මොකද මේ අම්මා අඬන්නේ ?" චමිලා

සුද්දාගෙන් විමසුවා ය.

"පුතේ උඹලාගේ අප්පච්චි කිතුලෙන් වැටිලා." සුද්දා එලෙස කිව් සැණින් චමිලාද මහ හඬින් හඬන්නට වූවා ය.

මේ කිසිවක් අදහාගත නොහැකිව තම මව දෙස බලා සිටි පාලිත ඉතා වේගයෙන් කිතුල දෙසට දිවුවේ ය. කිතුලට යන්නටත් පෙර ම පාලිතට තම පියා කඩ පිලේ ඉතා අමාරුවෙන් සිටිනු දැක ගත හැකි විය.

"අප්පච්චි... අනේ මගේ බුදු අප්පච්චි"

පාලිත කොතරම් කතා කළත් සෝමරත්න සිටියේ ඇඩ සිහියෙනි. දයාවති සහ චමිලා ද පවනට බඳු වේගයෙන් එතැනට දිව ආවෝ ය.

"අනේ මගේ දෙයියනේ මේ මොකද වුණේ ?"... දයාවති සහ චමිලා මහ හඬින් හඬන්නට වුවෝ ය. කඩේ සිටි පිරිස සෝමරත්නව රුක්වැල්ල ග්‍රාමීය රෝහලට ඇතුළත් කරන ලදී. එහිදී වෛද්‍යවරයා විසින් සෝමරත්නගේ කොන්ද කැඩී ඇති බවත් ඔහුට අවුරුදු කිහිපයක් යන තෙක් බෙහෙත් කිරීමට වන බවත් ඇවිදින්නට නොහැකි වන බවත් පවසා සිටියේ ය. මේ සිද්ධියෙන් දැඩි සේ කම්පනයට පත් පාලිත සහ චමිලා දින කිහිපයක්ම පාසලට නොගොස් නිවසේ වැඩ කටයුතු බලා ගත්තෝ ය. දයාවති දිනපතාම තම ස්වාමියා බැලීමට රෝහලට ගියා ය. ටික දිනකින් සෝමරත්න රෝහලෙන් නිවෙසට රැගෙන ඒමට වෛද්‍යවරුන් කැමැත්ත ලබා දුන්නෝ ය. ඔහුට ආවතේවකම් කිරීමට තිදෙනාම යුහුසුලු විය.
සෝමරත්නගේ පවුලේ උදවියට දිනෙන් දින මුදල් අඟහිඟකම් දැනෙන්නට පටන් ගත් හ. දයාවති කඩයප්පම් තම්බා කඩපොළවල් වලට දැමීමටත්, එළවළු විකිණීමටත් වෙහෙස මහන්සි විය. අරපිරිමැස්මෙන් මුදල් වියදම් කිරීමට වග බලා ගත් ඈ තම සැමියාගේ බෙහෙත් හේත් වලටත්, දරුවන්ගේ ඉගෙනීම් කටයුතු වලටත්, වෙනත් අවශ්‍යතා සඳහා මුදල් යෙදුවා ය. එසේම ඉන් කුඩා සොච්චම් මුදලක් ඉතිරි කර ගැනීමටද ඇය උත්සුක වුවා ය.

# 04.සිහිනය සැබෑ වීම

මෙසේ අවුරුදු කිහිපයක්ම ගෙවී ගියේ ය. සෝමරත්නට යම් තාක් දුරකට සුව වුවත් ඇවිදීමට කෙනෙකුගේ උපකාර අවශ්‍ය විය. චමිලා දැන් හැඩකාර තරුණියෙකි. ඇය උසස් පෙළ විභාගයෙන් පසුව විශ්ව විද්‍යාලයට තේරී පත් වී තිබුනේ වෛද්‍ය ශිෂ්‍යාවක් ලෙස ය.

මේ අතර පාලිත යුධ හමුදා සම්මුඛ පරීක්ෂණයට අයදුම් පත්‍රයක් යොමු කළේ ඔහුගේ කුඩා කළ සිහිනය සැබෑ කර ගැනීමටයි. ඔහු උසස් පෙළ විභාගයට පෙනී සිටියත් ඒ පිළිබඳ වැඩි විශ්වාසයක් ඇති කර නොගත්තේ පාඩම් කටයුතු හරි හැටි සිදු නොකළ නිසා ය.

"පුතේ, උඹ ඔය අදහස අත ඇරගනින් මට නං බෑ ඒ දරුවෝ විඳින දුක උඹත් විඳිනවා දකින්න."

ඒ අම්මාගේ මුවින් පිටවූ වදන් ය.

ඇය වාත අමාරු වලට විටින් විට භාජනය වන නිසා ඉතා අසීරුවෙන් පවුල නඩත්තු කිරීමට ද සිදු විය.

"අම්මා, මට ඕන කීයක් හරි හම්බ කරලා පවුල ගොඩ දාන්න. අක්කත් තවම ඉගෙන ගන්නවානේ."

"පුතේ මේ, උඹ අප්පච්චිවත් බලාගෙන වත්තේ පටියේ වැඩක් බලාගෙන හිටපන්." කියමින් දයාවති කුස්සියට රිංගා ගත්තා ය.

තම මවගේ අකමැත්තෙන් වුවත් හමුදා සම්මුඛ පරීක්ෂණයට  පෙනී සිටි පාලිතට දින කිහිපයකින්ම ඔහුගේ ප්‍රතිඵල ලැබුණේ ය. පාලිත හමුදා පරීක්ෂණයෙන් ඉහළින්ම සමත් වී තිබුණේ ඔහුගේ කුඩා කළ සිහිනය සැබෑවක් බවට පත් කරමිනි. කඩිනමින් හමුදා පුහුණු වීම් වලට ගිය ඔහුට එහිදී ඔහුගේ කුඩා කළ පාසල් මිතුරෙක් වූ විමුක්තිව මුණගැසුණේ ය. ඔවුන් දෙදෙනා පුහුණු කටයුතු වලට හා බාහිර කටයුතු වලට එකටම සහභාගී වුයේ තම තමන්ගේ මිත්‍රශීලි බව තවදුරටත් තහවුරු කර ගනිමිනි.

දෑ අවුරුද්දකින් පසුව පුහුණුවීම් කටයුතු අවසානයේ ඔවුන් දෙදෙනාව හමුදා සෙබළුන් ලෙස සේවයට බඳවා ගනු ලැබී ය. පාලිත සහ විමුක්ති දෙදෙනාට තම පළමු මෙහෙයුමට දායක වීමට ඉඩ ප්‍රස්ථාව ලැබුනේ කිසිවෙක් නොසිතූ ලෙස ය.

"අෑ බං, මට හිතාගන්නවත් බෑ අපිට මේ තරම් ඉක්මනට මිෂන් වලට යන්න පුළුවන් වුණේ කොහොමද කියලා."

පාලිත පුදුමයෙන් කීවේ ය.

"ඒක තමා කොහොමහරි පවරපු වැඩේ හරියටම කරන්න ඕනේ."

විමුක්ති ස්ථිර අදිටනින් කීවේය.

දිනෙන් දින කොටින් සමග සිදු කරන මේ මෙහෙයුමට කල් ළං වත්ම පාලිතගේ සහ විමුක්තිගේ තිබූ උනන්දුවද වැඩි වුණේ කළයකට වතුර පුරවන්නාක් මෙනි. පළමු සටනින් දෙදෙනාට කිසිදු අනතුරක් නොවූ නමුත් තුවාල වැනි සුළු සුළු ආබාධ ඇති විය.

මෙසේ අට අවුරුද්දක් නොදැනීම කාලය ගෙවී ගියේ ය. පාලිත දැන් දරුවන් දෙදෙනෙකුගේ පියෙකි. සෝමරත්නගේ සහ දයාවතිගේ මරණයෙන් පසුව ද ඔහු හමුදා නිළධාරියෙක් ලෙස සේවය කළේ ය. චමිලා දැන් වෛද්‍යවරියෙකි. විටින් විට තම සොහොයුරා පිළිබඳව සොයා බලන අෑ සෑම මසකදී ම තමාට දෙන වැටුපෙන් සුළු මුදලක් පාලිතගේ අත තබන්නීය. පාලිතටද වැටුපක් ලැබුණත් එයින් තම දරු පවුල හරි හැටි නඩත්තු කර ගැනීමට නොහැකි වන නිසා තම සොහොයුරියගෙන් ලැබෙන මුදලද ඔහුට මහත් රුකුලක් විය.

"මොනවද බං කල්පනා කරන්නේ ?"

විමුක්ති ඇසුවේ කඳවුරේ සිට අෑත බලන් සිටි පාලිතගෙනි.

"නෑ, මොකුත් නෑ.මං මේ හිතුවේ දරුවෝ දෙන්නා ගැන"

පාලිත ඉතා කනස්සල්ලෙන් කීවේ ය.

"උඹ හිතුවේ ඔය ප්‍රශ්නෙ උඹට විතරක් තියෙන දෙයක් කියල ද ?" විමුක්ති පැහැදිලි කරන්නට වුවේ ය.

"මෙතන අපිත් එක්ක ඉන්න හැම කෙනෙකුටම ඔය ප්‍රශ්නේ තියෙනවා. පොඩ්ඩක් හිතලා බලපන් මං ගැන. මම එහෙන් මෙහෙන් ණය වලට අහුවෙලා ඉන්නේ ඒ නිසා උඹ ඕවා ගැන හිතන්නේ නැතුව මේ වැඩේට විතරක් උඹේ ඔය හිත යොමු කරන්න. ඒකයි හොඳ."

විමුක්ති කඳවුර දෙසට ගියත් පාලිත සිටි තැනින් නොසෙල්වී සිටියේ ය. හමුදා කඳවුරේ ප්‍රධානියා එළඹෙන උදයේ දී තවත් මෙහෙයුමක් දියත් කරන බව පැවසුවේ පාලිත ඈත හිරු බැස යන අහස දෙස බලා සිටියදීම ය.

# 05. යුධබිම

එදා අලිමංකඩ මෙහෙයුම් දින උදා වුයේ තද වැස්සකුත් සමග ය. තවමත් යුධ සෙබළුන් කඳවුර දෙසට ඇදෙමින් සිටී. බැලූ සෑම පැත්තකම තුවාල වූ සෙබළුන් දැකගත හැකි විය. පාලිතට මේ සවස් යාමය දැනුණේ කරදරකාරයෙක් ලෙසයි. මන්ද මේ මුසල වැස්සත් සහ වෙඩි වැදී තැනින් තැන ඇද වැටී සිටි සෙබළුන්ගෙන් අමු සොහොනක් බවට පත් වූ කැළෑ රොදේ සිටීමට සිදු වන නිසා ය. කලකිරුණු සිතින් සිටි පාලිතට ඇති එකම සැනසීම වුයේ තම දරු පවුලයි. එහෙත් ඔහුට ඔවුන් ළඟට යෑමට නොහැකි ය. ඒ ඔහුත් මේ යුධබිමේ කොටස්කරුවෙකු වන බැවිනි. පාලිතටත් විමුක්තිටත් පාසල් කාලයේ මතකයන් ගොන්නක් තිබු නමුදු ඒවා මොහොතකට හිත යට තබා ගත්තේ මේ මාරාන්තික සටනේ අවසානය තෙක් ය.

අද දවසේ තම ජීවිතය ජීවත් කර ගැනීමට මේ මිතුරන් දෙදෙනාට හැකි විය. දවසේ මෙහෙයුම අවසන් වූ හෙයින් නැවත හමුදා කඳවුර වෙත ගියේ දෙදෙනාම ඉමහත් කුසගින්නෙන් යුතුව ය.

"ඒ විමුක්ති, උඹ බත් කෑවද ?"

පාලිත ඇසුවේ කලකිරුණු සිතිනි.

"අර බත් ඕංගෙන් බඩකට පිරෙනවද බං"

විමුක්ති සිටින්නේ කේන්තියකිනි.

"ඒකතමා" පාලිත එය අනුමත කළේ ය. පාලිතට සහ විමුක්තිට රාත්‍රිය එළැඹෙන බව දැනුණේවත් නැත. එතරම්ම ඔවුන්ට මේ යුද්ධය තිත්ත වී ඇත. හෙට යළිත් ඊළඟ සතුරු කඳවුරට පහර දීමට ඔවුනට සිදු වනවා ඇත. ඔවුන් දෙදෙනා තමන්ගේ යුධ ඇඳුම්, ආයුධ සකස් කර ගන්නට විය.

"විමුක්ති, මතක් කරලා අර හෙල්මට් එක ගනින්. උඹට අදත් ඕක අමතක වුණානේ."

පාලිත තම මිතුරාට මතක් කළේ ය.

"ගොඩක් පින් බං මතක් කළාට."

විමුක්තිට ඇස පියවෙන්නට විණි.

එදින පාලිත රෑ නින්දට ගියේ හිතේ දෙගිඩියාවෙනි. විමුක්තිට ද එය එසේම විය. හෙට කුමකින් කුමක් සිදුවේද යන්න පිළිබඳ ඔවුන්ට තිබෙන්නේ මහත් ප්‍රහේලිකාවකි.

පසුදා හිරු එළිය වැටෙන්නට විය. යුධ සෙබළුන්ගේ සිත් එකම අදහසකින් දෝංකාර වන්නට විය. කෙසේ හෝ මව්බිම වෙනුවෙන් තමාගේ උපරිමය සිදු කරන්නට ඔවුන් ප්‍රතිඥා දී සිටියෝ ය. මහත් දුක් කම්කටොළු විඳ දරා ආ මේ ගමන කෙසේ හෝ ජය ගැනීමේ අදිටනින් සතුරු කඳවුර වෙත තම පය තැබූ සෙබළුන් අතර පාලිත හා විමුක්ති ද සිටියහ. ඔවුන් ටිකෙන් ටික සතුරු කඳවුර වෙත ළං වූහ. එසේම ඔවුන්ගේ හෘද ස්පන්දන වේගයද ඉහළ යන්නට විය. පාලිත සහ විමුක්තිට එකම ස්ථානයකදී සතුරන්ට පහර දීමට සිදුවිය. තවමත් සතුරන්ට ඔවුන් අසළ සිටින බවට ඉවක්වත් දැනුණේ නැත. පාලිත විමුක්තිට මෙසේ කීවේ ය.

"අපිට පුළුවන් මේක කරන්න."

විමුක්ති තම කටහඬ අවදි කළේ ය.

"ඔව්, අපි මේ කරන හැම දෙයක්ම අපේ රට වෙනුවෙන් , අපේ උපරිමයෙන්ම කරමු." පාලිත සහ විමුක්ති මුහුණට මුහුණ බලා සතුරන්ට පහර දීමට අදාළ සංඥාව දෙනතෙක් බලා සිටියහ. සංඥාව ක්‍රියාත්මක වුණි. වෙඩි හඬ මහා වන මැද කණ පිපිරී යන මෙන් ඇසෙන්නට විණි. මොහොතක් ගත වුණි. පාලිත දෙසට වෙඩි උණ්ඩයක් ඉතා වේගයෙන් ඇදී ආවේ කිසිවෙක් නොසිතූ ලෙස ය.

“ආහ්...”

පාලිතට කෑ ගැස්සුණි.

“පාලිත.....”

විමුක්ති පාලිතට කොතරම් කතා කළත් පාලිත එතැනම ඇද වැටුණි. සැණෙකින් පාලිතට වෙඩි තැබූ ත්‍රස්තවාදියාට විමුක්ති කෑ ගසමින් පිට පිට වෙඩි ප්‍රහාර එල්ල කළේ ය. පාලිත මෙන් ත්‍රස්තවාදියාද කෑ මොර දෙමින් බිම ඇද වැටුණි. විමුක්ති අවට පරිසරය හොඳින් විපරම් කළ බැලුවේ තවත් ත්‍රස්තවාදීන් සිටිනු ඇත්දැයි සොයා බැලීමටයි. නමුත් කිසිවෙකුත් අවට නොසිටියහ.

ඈතින් ඇසෙන වෙඩි හඬ මැද්දේ විමුක්ති පාලිත අසළට වහා දිව ගියේ ඔහුට ප්‍රතිකාර ලබා දීමට හමුදා රෝහල වෙත රැගෙන යාම සඳහායි.

“පාලිතගේ හෘද ස්පන්දන වේගය වැඩි වන්නට විය.

“පාලිත..... පාලිත නැගිටපන් බං”

පාලිතට විමුක්තිගේ හඬ ඇසුණත් ඊට ප්‍රතිචාර දැක්වීමට තරම් ශක්තියක් ඔහු තුළ නොවීය. විමුක්තිට පිළිතුරු දීමට හඬ අවදි කළත් ඔහු ඉතා අසීරුවෙන් මේ වචන පෙළ ගැට ගසා ගත්තේ ය.

“විමුක්ති, මට අද හරි සතුටු දවසක් බං.... ”

“ඇයි බං එහෙම කියන්නේ?”

“මම අද රටට ණය නැති සිංහල පුතෙක් වෙන නිසා” විමුක්තිට මේ පාලිතගේ අවසාන මොහොතයැයි හැඟුණ නිසා ඔහුගේ හිත සැනසීමට ඉටා ගත්තේ ය.

“ඔව්, අද උඹ රටට ණය නැති රණවිරුවෙක් උනා බං. ” විමුක්තිගේ ඒ වදන් පෙළ ඇසෙන විට රුධිරය තැවරුණු, වෙව්ලුණු දෑත් එක් කොට වඳිනවාත් සමඟ පාලිතගේ දෙනෙත් සෙමින් අඬවන් විය.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින්  රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම  වැනි බහුවිධ පරමාර්ථ ඇතිව  2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන  ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි .පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට  මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි  ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි  පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන්  ග්‍රන්ථකරණයට යොමුකළ

ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

9 786242 069760